රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :-04/2000

මගේ අංකය :-ආ/VIII/04ශ්‍රී.ලං.තා.සේ. II වෙළුම
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2000.01.26

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත.

**අංක 1094/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් පළ කරන ලද**
**ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම.**

1999.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1094/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 4.0 , 6.0 , 8.0, 9.0 සහ 10.0 ඡේද පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

**02. 4.0 වැටුප් පරිමාණය ව්‍යුහය හා සේවක සංඛ්‍යාව :-**

"පුහුණු කිරීමේ ශ්‍රේණියේ සිට I පන්තිය දක්වා සේවක සංඛ්‍යා අනුපාතයක් නොමැති වන අතර, මුළු තනතුරු සංඛ්‍යාව එක් එක් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව තීරණය කරනු ඇත'' යන ඡේදයට පසුව "පහත සඳහන් වැටුප් ක්‍රම 1997.01.01 දින සිට බලපැවැත්වේ'' යන වාක්‍යය අලුතින් ඇතුළු කෙරේ.

**03. 6:0 බඳවා ගැනීම**

6.1, 6.2 ඡේද නොවෙනස්ව බල පැවැත්වේ.

6:3 ඡේදය සම්පූර්ණයෙන් ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ. "පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා පහත (I) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ පහත (II) හි සඳහන් මූලික තාක්ෂණ සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

(I) සේවයට අදල විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම.

හෝ

(II) ජාතික තාක්ෂණ සහතිකය හෝ රජයේ කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳව එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලැබූ වෙනත් තාක්ෂණ සුදුසුකමක්.

සහ

භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම."

6:3:1, 6:3:2 සහ 6:3:3 ඡේද නොවෙනස්ව බලපැවැත්වේ.

**04. 6:4 බඳවා ගැනීමේ සුදුසුකම්**

6 :4:1 උපඡේදයේ (VII) ට අනතුරුව පහත සඳහන් සටහන ඇතුළු කෙරේ.

"ඉහත (V) හි සඳහන් විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව හිමි අයදුම්කරුවන් එම ඩිප්ලෝමාව හැදෑරීමට ඇතුලත් වීම සඳහා වන ''පදනම් පාඨමාලාව'' සාර්ථකව හදරා ඇත්නම් ඔවුන් අ.පො.ස.(සා.පෙළ)විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැක.

එසේ වුවත් මොවුන් රාජ්‍ය භාෂාවේ ප්‍රවීනතාවය පිළිබඳ අවශ්‍යතාවය සපුරා තිබිය යුතුය. තවද අංක 1094/2 දරණ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාව පිළිබඳ ව්‍යවස්ථාවේ 6:3(II) හි සහ 6.4.1 හි සඳහන් තාක්ෂණ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් එම පාඨමාලා හැදෑරීමට බඳවා ගන්නා අවස්ථාවේදී එම පාඨමාලාවන්ට ඇතුලත්වීමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය''

**05. 9.0 දෙපාර්තමේන්තු පරීක්ෂණ හා කාර්යක්ෂමතා කඩඉම්**

(IV) උප ඡේදය : දැනට ඇති (IV) උප ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් උප ඡේදය ඇතුලත් කෙරේ.

''IV 1999.08.23 වන දිනට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් නිදහස් කර ඇති හා ඉදිරියේදී නිදහස් කරනු ලබන නිලධාරීන් වෙතොත් ඔවුනට පෞද්ගලික වන සේ නව ව්‍යවස්ථාවේ සඳහන් උසස්වීම් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ''

(V) උප ඡේදය : දැනට ඇති V උප ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් උප ඡේදය ඇතුලත් කෙරේ.

"(V) I වන පන්තියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා කළමනාකරණය සහ අභියෝග්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත විභාගයක් මණ්ඩලයේ මග පෙන්වීම යටතේ විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ. විශේෂ පන්තියේ පුරප්පාඩු වලින් 40% ක් මෙම විභාගයෙන් සමත් අයගෙන් පුරවනු ලැබේ. එසේ වුවත්, විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේදී ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන පන්තියේ අවුරුදු 10 ක් හෝ ඊට වඩා පළපුරුද්දක් ඇති නිලධාරීන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. ඒ සඳහා පහත සඳහන් ප්‍රතිශතයන් අනුව නියමිත විභාගයෙන් සමත් නිලධාරීන්ගෙන් පුරප්පාඩු පිරවිය යුතුය.:-

2000.12.31 දක්වා 20%
2001.12.31 දක්වා 21%
2002.12.31 දක්වා 22% .....................යනාදි වශයෙන් එක් වර්ෂයකදී 1% කින් වැඩිවන ආකාරයට 2020.12.31 සිට ඉදිරියට 40% පරිදි ක්‍රියාත්මක කෙරේ.''

**06. <u>10.0 අන්තර්කාලීන විධිවිධාන</u>**

10 (II) උප ජේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් උප ජේදය ආදේශ කරනු ලැබේ.

"10 (II) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/94 හා 27/94 (1) අනුව මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවේ නිලධාරීන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කෙරෙන අවස්ථාවේ සිටි පන්තියේ/බණ්ඩයේ හිමි සේවා කාලය අන්තර්ග්‍රහණය කරනු ලැබූ පන්තියේ/බණ්ඩයේ සේවා කාලය ලෙස සලකනු ලැබේ''

07. මෙම ව්‍යවස්ථාවේ I I "අ'' පන්තිය, II "ආ'' පන්තිය යන යෙදුම සඳහන් සෑම ස්ථානයකම එම යෙදුම ඉවත් කර ඒ වෙනුවට II පන්තිය, "අ'' බණ්ඩය , II පන්තිය "ආ'' බණ්ඩය යන යෙදුම ආදේශ කළ යුතුය.

08. ඉහත සංශෝධන සමඟ කියවෙන සංශෝධිත ව්‍යවස්ථාවට අනුරූපවන පරිදි ඒ ඒ තනතුරු වල බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය.



(මහින්ද බන්දුසේන)
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය